# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

## පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදාහැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

අප ආයතනය පහත සදහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. ස්ථානභාර නිලධාරී - රාජ්‍ය ඔසුසල (JM 1.1) II ශ්‍රේණිය

**<u>සුදුසුකම්</u>**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඖෂධවේදය පිළිබඳ උපාධියක් ලබා තිබීම

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබාගත් වෙනත් ඒ හා සමාන උපාධියක් ලබා තිබීම

සහ

(ඇ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඇ) රජයේ/ සංස්ථාවක/ මණ්ඩලයක/ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ඖෂධවේදියකු ලෙස අවම වශයෙන් වසර 01 ක පශ්චාත් සේවා පළපුරුද්ද.

වැටුප් පරිමාණය : රු. 53,250/-, 945/- x 10 , 1,420 /- x 18 = 88,260/-
(දළ මාසික වේතනය රු. 145,842/- ක් පමණ වනු ඇත)

වයස් සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බලනොපායි.)

### 2. ප්‍රසම්පාදන නිලධාරී (JM 1.1) II වන ශ්‍රේණිය

**<u>සුදුසුකම්</u>**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් රසායන විද්‍යාව විෂයය ඇතුළත් විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.

සහ

(ආ) පරිඝණක සාක්ෂරතාවය

සහ

(ඇ) රජයේ / සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ටෙන්ඩර් ප්‍රසම්පාදන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සේවා පළපුරුද්ද.

වැටුප් පරිමාණය : රු. 53,250/-, 945/- x 10 , 1,420 /- x 18 = 88,260/-
(දළ මාසික වේතනය රු. 145,842/- ක් පමණ වනු ඇත)

වයස් සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බලනොපායි.)

**3. පද්ධති විශ්ලේෂක ((MA 2.1) III වන ශ්‍රේණිය - (AS 400 පද්ධතිය සඳහා)**

**I. <u>අධ්‍යාපන සුදුසුකම්</u>**

(අ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන්, දෙවරකට නොවැඩි වාර ගණනකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ තවත් එක් විෂයක් ඇතුළත්ව සම්මාන හතරක් සහිතව විෂයන් 06කින් සමත්ව සිටීම.

සහ

(ආ) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස (උ/පෙළ) විභාගය සමත්ව සිටීම.

සහ

**II. <u>වෘත්තීය සුදුසුකම්</u>**

(අ) i. ජාතික ව්‍යාපාර කළමණාකරණ ආයතනය (NIBM) මගින් පිරිනමනු ලබන පරිසනක පාදක තොරතුරු පද්ධති පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක් ලබා තිබීම

හෝ

ii. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ NVQ 5 වන මට්ටම ට නොඅඩු වෙනත් ඒ හා සමාන ඩිප්ලෝමා පාඨමාලාවක්

සහ

(ආ) රජයේ / සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පරිසනක වැඩ සටහන් ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 3 ක පශ්චාත් සේවා පළපුරුද්ද

වැටුප් පරිමාණය : රු. 37,890/- 375/- x 10, 440 /- x 7, 620/- x 4, 825/- x 20 - 63,700/-
(දළ මාසික වේතනය රු. 115,914/- ක් පමණ වේ)

වයස් සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

**4. පද්ධති සහායක සහකාර ((MA 2.1) III වන ශ්‍රේණිය**

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් අනුමත තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයකින් පිරිනමනු ලබන පරිසනක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය (IT) සම්බන්ධයෙන් මෘදුකාංග (Software) සහ දෘඩාංග (Hardware) ආවරණය වන පරිදි NVQ 5 වන මට්ටම ට නොඅඩු සහතිකයක් ලබා තිබීම

වැටුප් පරිමාණය : රු. 37,890/- 375/- x 10, 440 /- x 7, 620/- x 4, 825/- x 20 - 63,700/-
(දළ මාසික වේතනය රු. 115,914/- ක් පමණ වේ)

වයස් සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.)

අයදුම්කරුවන්,

i. ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය

ii. තනතුරේ රාජකාරි නිසියාකාරව කිරීමට අවශ්‍ය කායික හා මානසික ශක්තිය තිබිය යුතුය.

iii. සුපිලිපන් චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

තෝරා ගත් අයදුම්කරුවන් හට මාසික පැමිණීමේ දිරි දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය, වාර්ෂික ප්‍රසාද දීමනා, සමාජයීය ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයාට හා පවුලේ අය සඳහා රෝහල්ගත වීමේ වෛද්‍ය රක්ෂණාවරණය ඇතුළත්ව ආකර්ශනීය ප්‍රතිලාභ රැසක් හිමි වේ.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ ජීව දත්ත සමග අයදුම්පතෙහි, වයස, සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වත්මන් තනතුර, වැටුප හා වැටුප් පරිමාණය, දරන ලද පෙර තනතුරු හා පෙර සේවා යෝජකයන්ට සම්බන්ධ වූ සහ ඉවත් වූ දිනයන් යන කරුණු ඇතුළත් කොට **ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහතිකවල පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග යොමු කළ යුතුය. අදාල සහතිකවල පිටපත් නොමැතිව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

**අයදුම්පත් බහාලු ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.** රජයේ /සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාල ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. සියළුම අයදුම්පත් **2026.04.06 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) - වැඩ බලන**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,**
**“මෙහෙවර පියෙස”, 16 වන මහල, නො. 41,**
**කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.**
**දුරකථන අංකය 0112 320 356 -9**